**ශ්‍රී ලංකා රේගුව**
අංක 40, කෙලින් විදිය, කොළඹ11

*www.customs.gov.lk*

# ශ්‍රී ලංකා රේගුව

# උපායමාර්ගික සැලසුම

# 2024-2028


CUSTOMS
HANSAKAWA
COLOMBO





# පටුන

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | 4 |
| උපායමාර්ගික මාර්ග සිතියම | 5 |
| විධායක සාරාංශය | 6 |
| උපායමාර්ගික අභිමතාර්ථ | 8 |
| අපගේ  දැක්ම, මෙහෙවර සහ වටිනාකම් | 10 |
| වත්මන් තත්ත්වය සහ අභියෝග | 11 |
| ඉදිරි ගමන | 15 |
| ඉලක්කගත ක්ෂේත්‍රය 01ඃ ආදායම | 16 |
| ඉලක්කගත ක්ෂේත්‍රය 02ඃ වෙළඳාම සඳහා පහසුකම් සැළසීම | 18 |
| ඉලක්කගත ක්ෂේත්‍රය 03ඃ පාරිසරික-සමාජීය ආරක්ෂාව | 20 |
| ඉලක්කගත ක්ෂේත්‍රය 04ඃ ආයතනික සංවර්ධනය | 22 |


Block-A



# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය

2024 වසර ආරම්භයේදී ශ්‍රී ලංකා රේගුවේ දිශානතිය දැක්වෙන, ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපායමාර්ගික ලේඛනයක් වන, ඉදිරි වසර පහ සඳහා වන "උපායමාර්ගික සැලසුම 2024-2028" හඳුන්වාදීමට ලැබීම සතුටකි. මෙම සැලසුමෙහි ඇතුළත් ප්‍රතිපත්ති සහ උපායමාර්ග මඟින් ජාතික අවශ්‍යතාවන් සහ ඉහල අපේක්ෂාවන් සපුරාලීම සාක්ෂාත් කරමින් ශ්‍රී ලංකා රේගුවේ අනාගත මගපෙන්වීම අරමුණු කෙරේ. රට මුහුණ දෙන අනපේක්ෂිත ආර්ථික අර්බුදය මධ්‍යයේ ප්‍රධාන ආදායම් උත්පාදනය කරන දෙපාර්තමේන්තුවක් ලෙස ශ්‍රී ලංකා රේගුව ක්‍රියාත්මක වන බැවින් මෙය අතිශයින් වැදගත් වේ.

වසර 2023 දී, වෙළඳ හිඟය පාලනය කිරීම අරමුණු කරගත් ආනයන සීමාවන් පනවා තිබියදීත් ඉතිහාසයේ මෙතෙක් ලද වැඩිම ආදායම් රැස්කිරීම මඟින් ශ්‍රී ලංකා රේගුවේ ප්‍රශංසනීය ප්‍රයත්නයන් පෙන්නුම් කෙරේ. එකී ජයග්‍රහණයන් පිටුපස ඇති විභව්‍යතාවන් සැළකිල්ලට ගනිමින් සහ ශ්‍රී ලංකා රේගුවේ සීමාවන් සහ දුර්වලතාවන් පිළිබඳ පුළුල් අවබෝධය දිරිමත් කරමින් මෙම උපායමාර්ගික සැලසුම ඉතා සුපරීක්ෂාකාරී ලෙස සකස්කර ඇත.

ශ්‍රී ලංකා රේගුවේ කාර්යයන්ට අනුකූලව ඉලක්කගත ක්ෂේත්‍ර හතරක් හඳුනාගෙන ඇත. ඒවා නම්, ආදායම, වෙළඳාම සඳහා පහසුකම් සැළසීම, පාරිසරික-සමාජීය ආරක්ෂාව සහ ආයතනික සංවර්ධනයයි. මෙම උපායමාර්ගික සැලැස්ම මගින් ඉහත සඳහන් ඉලක්කගත ක්ෂේත්‍රයන්හි අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අභිමතාර්ථ සකස්කර උපායමාර්ග ලබාදේ. එසේම, මෙම උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේදී, ආයතනයේ දැක්ම සහ මෙහෙවර ප්‍රකාශ සඳහා නව අර්ථ නිරූපනයන් පවා ලබා-දෙමින් නව්‍ය ප්‍රවේශයක් අනුගමනය කිරීමේ ප්‍රයත්නයක් දරා ඇත.

ජාත්‍යන්තර වෙළඳාම සඳහා පහසුකම් සළසන, ප්‍රධාන දේශසීමා පාලන නියෝජිතායතනය වන ශ්‍රී ලංකා රේගුව, ලෝක රේගු සංවිධානය (WCO) සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) වැනි ජාත්‍යන්තර සංවිධාන විසින් දක්වන ලද ප්‍රමිතීන්ට අනුව ක්‍රියාවලි සහ ක්‍රමවේද සකස් කර ඇත. මෙම උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමේදී ඒ පිළිබඳව සැළකිලිමත් වී තිබේ. ඊට අමතරව, අදාල එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් ලබාදෙන නිර්දේශ පිළිබඳව ද අවධානය යොමුකර ඇත.

මෙම උපායමාර්ගික සැලැස්ම අප නිලධාරීන්ගේ සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කරන්නේ ඉමහත් සතුටිනි. වැඩමුළු ගණනාවකදී සාකච්ඡා කරන ලද සිය දැනුම සහ පළපුරුද්ද මගින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට කණිෂ්ඨ මට්ටම දක්වා සෑම මට්ටමකම නිලධාරීන්ගෙන් උකහා ගත් අදහස් හා යෝජනා එයට ඇතුළත්ය. එය මෙම ලේඛණයට සැළකිය යුතු වටිනාකමක් එක්කර ඇත. මෙම උපායමාර්ගික සැලැස්මෙහි දක්වා ඇති අභිමතාර්ථ සියල්ල ළඟාකර ගැනීම අභියෝගාත්මක බව අවබෝධකර ගන්නා අතරම, දෙපාර්තමේන්තුව ඉදිරියට ගෙන යන බලය ලෙස කටයුතු කරන ශ්‍රී ලංකා රේගුවේ සියළු නිලධාරීන් අභියෝගාත්මක කාල සීමාවන් තුළ ශ්‍රී ලංකා රේගුව ඉදිරියට ගෙන යාමට සහ රජයේ මෙන්ම රටේ අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා සිය පූර්ණ සහය ලබාදෙනු ඇති බව මාගේ විශ්වාසයයි. තවද, මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සහ ඕස්ට්‍රේලියානු දේශ සීමා බලකාය (Australian Border Force) විසින් ලබාදෙන ලද සහය සහ පහසුකම් සැළසීම අපි අගය කරන්නෙමු.

මෙම උපායමාර්ගික සැලැස්ම යථාර්තයක් බවට පත්කිරීම සඳහා කලින් කලට ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ අපගේ උද්‍යෝගීමත් සේවකයින් අතර අදහස් හුවමාරුකර ගැනීම දිරිමත් කරන්නෙමි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම උපායමාර්ගික සැලැස්මෙහි ඉතා වැදගත් ක්ෂේත්‍ර ලෙස හඳුනාගනු ලැබූ කාර්යක්ෂම රේගු පරිපාලනය, කාර්ය ඉලක්ක කරගත් කැපවීම සහ සුපිළිපන්බව හරහා ශ්‍රී ලංකා රේගුව තවදුරටත් ශක්තිමත් කළ හැකි බව මාගේ විශ්වාසයයි.

පී.බී.එස්.සී. නෝනිස්
රේගු අධ්‍යක්ෂ ජනරාල්

## ශ්‍රී ලංකා රේගුව

# උපායමාර්ගික සැලසුම 2024-2028

## ශ්‍රී ලංකා රේගුවේ උපායමාර්ග පිරමීඩය


ශ්‍රී ලංකා රේගුව ශක්තිමත් දේශසීමා හරහා ළඟාකරගත් ආරක්ෂිත සහ සමෘද්ධිමත් දේශයක් අපේක්ෂා කරයි. ආදායම සුරක්ෂිත කිරීම, සමාජය ආරක්ෂා කරන සහ වෙළඳාම සඳහා පහසුකම් සපයන ස්ථිර සුපිළිසන්භාවයෙන් සහ වෘත්තීයභාවයෙන් ඉදිරියට යන ලොව ප්‍රමුඛ පෙළේ රේගු සේවාවක් සැපයීම අපගේ මෙහෙවරයි. අප මෙම ගමන ආරම්භ කිරීමේදී ආර්ථික සෞභාග්‍ය සඳහා දායකවෙමින් සහ සියලු දෙනා සඳහා උසස් අනාගතයක් සුරක්ෂිත කරමින් අනන්‍ය ප්‍රමිතීන් දැක්වීම අපගේ කැපවීමයි.

- **ආදායම උපරිමකරණය**
  ලැබිය යුතු ආදායම එකතු කිරීම, ආදායම අහිමිවීම වැළැක්වීම සහ නව මාවත් සොයායාම

- **නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැළසීම**
  වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූලවීම, වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ රජයේ ප්‍රතිපත්ති ඵලදායි සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම සහ අනුකූල නොවන වෙළඳාම වැළැක්වීම

- **දේශසීමා හරහා කාර්යක්ෂම පාලනය මගින් ජනතාව සහ පරිසරය ආරක්ෂා කිරීම**
  රටවල් අතර දේශසීමාවන් හරහා සිදුවන අපරාධ සහ වැරදි වැළැක්වීම, ජාත්‍යන්තර ගිවිසුම් සහ ජාතික ප්‍රමිතීන් කෙරේ අනුකූලතාවය වැඩිදියුණු කිරීම, දේශීය සහ විදේශීය දේශසීමා නියාමන නියෝජිතායතන සමග සබඳතාවන් වැඩිදියුණු කිරීම, පාරිසරික-සමාජ ආරක්ෂාව පිළිබඳ හොඳින් දැනුවත්වූ පුරවැසියන් බිහිකිරීම

- **විශිෂ්ඨත්වය ළඟාකර ගැනීම සඳහා ආයතනය පරිවර්තනය කිරීම**
  පර්යේෂණ සහ නව්‍යකරණය හරහා ක්‍රියාවලි සහ ක්‍රමවේද ක්‍රමවත් කිරීම, මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම, ආයතනික සංවර්ධනය සඳහා පර්යේෂණ ආරම්භ කිරීම, සම්පත් ප්‍රශස්තකරණය, ප්‍රශස්ත ක්‍රියාවලි අනුගත කරගැනීම, අනෙකුත් නියෝජිතායතන සමග හවුල්කාරිත්වයන් ඇතුළුව ආයතනික සංවර්ධනය සළකා බැලීම, සුපිළිපන් රාමුවක් සහ ආයතනික සංස්කෘතියක් වැඩිදියුණු කිරීම.




**වෘත්තීයභාවය**
උසස් තත්වයේ සේවාවක් සැපයීමේ අභිමානය අප සතුවේ.

**සුපිළිපන්භාවය**
අප අවංක සහ සදාචාරාත්මක හැසිරීම දිරිමත් කරන්නෙමු.

**වගකීම**
අප කරන කාර්යයන්හි වගකීම අපි භාරගන්නෙමු.

**විනිවිදභාවය**
අප විවෘතභාවය සහ පුරෝකථනය කිරීමේ හැකියාව පවත්වා ගන්නෙමු.

**නව්‍යකරණය**
අපි අළුත් දේ සොයා යන්නෙමු.

**සාමූහික ප්‍රයත්නය**
අපි එකමුතුකමේ බලය විශ්වාස කරන්නෙමු

# විධායක සාරාංශය

දීර්ඝ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකා රේගුව රාජ්‍ය ආදායමට සැළකිය යුතු දායකත්වයක් සපයන බැවින්, ශ්‍රී ලංකාව මුහුණදෙන වත්මන් ආර්ථික අර්බුදය හමුවේ රට ඉදිරියට ගෙනයාමේ දී ඉතා වැදගත් කාර්යයක් ඉටුකරයි. වසර 2023 දී, ආනයන සීමාවන් යටතේ වුවද ශ්‍රී ලංකා රේගුව, ඉතිහාසයේ මෙතෙක් ලද වැඩිම ආදායම ළඟාකරගත් අතර, රේගුව සතු දක්ෂ මානව සම්පත සහ රේගු කළමනාකරණයේ නව්‍ය ප්‍රවේශයන් මෙම ජයග්‍රහණය තුළින් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකා රේගුවේ දක්ෂ කාර්ය මණ්ඩලය, අර්බුදකාරී කාලසීමාව තුළ අනුගමනය කරනු ලැබූ ක්‍රමවේදයන් සහ ශක්තිමත් තොරතුරු සන්නිවේදන තාක්ෂණය මත රඳාපවතිමින් ආයතනය පාලනය කිරීම නිසා මෙම විශිෂ්ඨ ජයග්‍රහණය ළඟාකර ගැනීමට හැකිවිය. තවද, අවදානම්පාදක වරණීයතා යාන්ත්‍රණය (Risk Based Selectivity Mechanism) සහ ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝගීතාවය මගින් විශිෂ්ඨත්වය ළඟාකර ගැනීම වැනි කාරණා සම්බන්ධව ශ්‍රී ලංකා රේගුවේ කැපවීම පෙන්නුම් කර ඇත. මනාව ස්ථාපිත නෛතික රාමුව හා රේගු ආඥා පනත ශ්‍රී ලංකා රේගුවට නෛතික බලය පවරන අතර, ත්‍යාග යෝජනා ක්‍රමය හරහා රේගුවේ සේවය කරන නිලධාරීන්ට මූල්‍යමය දිරිගැන්වීම ලබා දී ඇත.

පද්ධති ස්වයංක්‍රීයකරණය (System Automation) හඳුන්වාදීමත් සමග 1992 වසරේ සිට ආරම්භ කරන ලද නව්‍යකරණ පරිවර්තනය ශ්‍රී ලංකා රේගුවේ සාර්ථකත්වයේ අනන්‍ය සළකුණ වේ. කඩදාසි රහිත ලේඛණ සැකසීම සහ අනෙකුත් රාජ්‍ය ආයතන, ASYCUDA පද්ධතිය හා ඒකාබද්ධ කිරීම COVID-19 කාලසීමාව තුළ ලඟාකරගත් සැළකිය යුතු ජයග්‍රහණයන්ට ඇතුළත්ය. අවදානම්පාදක ප්‍රවේශයක් කරා මාරුවීම සහ හවුල්කාරීත්ව වැඩසටහන් හරහා වෙළඳුන් සඳහා පහසුකම් සැළසීම මගින් කාර්යක්ෂම වෙළඳ ක්‍රියාවලීන් සඳහා ශ්‍රී ලංකා රේගුවේ කැපවීම අවධාරණය කර ඇත.

ශ්‍රී ලංකා රේගුව, ආර්ථික අර්බුදය මධ්‍යයේ ඉහළ ආදායම් ඉලක්ක ලබාදීම, වෘත්තීය සංවර්ධනය සඳහා ඇති අවශ්‍යතාවන් සහ සෘණාත්මක මහජන ප්‍රතිරූපය වැනි අභියෝගයන්ට මුහුණ දෙමින් සිටී. සිය ඉදිරි ගමනේදී, ශ්‍රී ලංකා රේගුවේ උපායමාර්ගික සැලසුම මඟින් ලැබිය යුතු ආදායම සුරක්ෂිත කිරීම, ක්‍රියාවලීන් ක්‍රමවත් කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ලඟාකර ගැනීම සිදුකරන අතරම මෙම අභියෝගයන්ට විසඳුම් ලබාදීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), තිරසර සංවර්ධන අභිමතාර්ථ (SDG) මඟින් ලබාදෙන නිර්දේශ සහ ගෝලීය වෙළඳ ගතිකතාවන් හඳුනා ගැනීම, අනාගත ක්‍රියාමාර්ගයන්ට මගපෙන්වනු ඇත. එමෙන්ම, 2024 දී ASYHUB පද්ධතිය දියත් කිරීම අනාගත තාක්ෂණික අභිවර්ධනය සඳහා ඇති කැපවීම පිළිබඳ සංඥාවකි.

ඉදිරි වසර පහ සඳහා වන ශ්‍රී ලංකා රේගුවේ උපායමාර්ගික සැලසුම ප්‍රධාන ක්ෂේත්‍ර හතරක් වටා ගොඩනැගී ඇත. ඒවානම් ආදායම, පාරිසරික-සමාජීය ආරක්ෂාව, වෙළඳාම සඳහා පහසුකම් සැළසීම සහ ආයතනික සංවර්ධනයයි. මෙම ක්ෂේත්‍ර ඔස්සේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව කටයුතු කරමින්, නව්‍යකරණය අනුගත කරගනිමින් සහ අභියෝගයන්ට විසඳුම් ලබාදෙමින් ආර්ථික අවිනිශ්චිතතාවන් හමුවේ ශක්තිමත් සහ කාර්යක්ෂම රේගු පරිපාලනයක් ලෙස නැගීසිටීම ශ්‍රී ලංකා රේගුවේ අරමුණයි.


MAERSK



# උපායමාර්ගික අභිමතාර්ථ

සම්ප්‍රදායානුකූලව, රේගුව මූලික ක්ෂේත්‍ර හතරක් කෙරෙහි අවධානය යොමු කෙරේ. ඒවා නම් ආදායම එකතු කිරීම, නීතිය බලාත්මක කිරීම, වෙළඳාම සඳහා පහසුකම් සැළසීම සහ සමාජ ආරක්ෂණය වේ. කෙසේවුවද, ශ්‍රී ලංකා රේගුවේ අනාගතය දෙස බැලීමේදී, ජාත්‍යන්තර වෙළඳාමේ පසුබිම වෙනස්වීම් පිළිගැනීම සහ රටේ වෙළඳ රටාවන් වැඩිදියුණු කිරීමේ දී ඉදිරි වසර පහ තුළ ශ්‍රී ලංකා රේගුව විසින් විසඳුම් ලබාදෙනු ඇති ඉතා වැදගත් ක්ෂේත්‍ර මෙම උපායමාර්ගික සැලසුමෙහි හඳුනා ගැනේ. ආදායම, නීත්‍යා-නුකූල වෙළඳාම සඳහා පහසුකම් සැලසීම, පාරිසරික සමාජීය ආරක්ෂණය සහ ආයතනික සංවර්ධනය මෙයට ඇතුලත්ය. 2024 සිට 2028 දක්වා වන කාලසීමාව තුළ මෙම මූලික ක්ෂේත්‍ර මගින් ව්‍යුත්පන්න වූ පහත දැක්වෙන උපායමාර්ගික අභිමතාර්ථ ළඟාකර ගැනීමට සැලසුම් කෙරේ.



### 1 වන අභිමතාර්ථය : ආදායම් උපරිම කරණය

රජයේ ආදායම් ඉලක්ක ළඟාකර ගැනීම සහ ආර්ථික අර්බුදය මධ්‍යයේ ජාතික ආර්ථිකයට දායකත්වය ලබාදීම.



### 2 වන අභිමතාර්ථය : නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැළසීම

රටේ ආර්ථික සංවර්ධනයට ඉතාමත් වැදගත් වන වෙළඳ පරිමාව පුළුල් කිරීම අරමුණු කරගෙන නීත්‍යානුකූල නොවන වෙළඳුන් හඳුනා ගනිමින් සහ ඔවුන් පිළිබඳව විශේෂයෙන් සළකා බලමින් නීත්‍යානුකූල වෙළඳුන් සඳහා පහසුකම් සැළසීම.



### 3 වන අභිමතාර්ථය: දේශසීමා අතර කාර්යක්ෂම පාලනයක් හරහා ජනතාව මෙන්ම පරිසරය ද ආරක්ෂා කිරීම

දේශසීමාවන් පාලනය කරමින් රටේ සමාජය, ජෛව විවිධත්වය, සංස්කෘතිය සහ ජාතික උරුමයන් ආරක්ෂා කිරීම.



### 4 වන අභිමතාර්ථය: විශිෂ්ඨත්වය ළඟාකර ගැනීම සඳහා ආයතනික පරිවර්තනය

ශ්‍රී ලංකා රේගුවේ අභිමතාර්ථ ළඟාකර ගැනීමේදී රේගු සේවාවන්හි කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාශීලි ආයතනික සංවර්ධනයක් සහතික කිරීම.


CUSTOMS
CUSTOMS

## දැක්ම

**"ශක්තිමත් දේශසීමාවන් හරහා ආරක්ෂිත හා සමෘද්ධිමත් දේශයක්"**

---

## මෙහෙවර

**"ආදායම සුරක්ෂිත කිරීමත්, පරිසරය හා සමාජය ආරක්ෂා කිරීමත් බාධක රහිත වෙළඳ ප්‍රවාහයක් මෙන්ම සංචාර ප්‍රවර්ධනය කිරීමත් සඳහා සුපිළිපන්භාවය සහ වෘත්තියභාවය සහිත ලොව පළමු පෙළේ රේගු සේවාවක් සැපයීම"**

---

## වටිනාකම්

**වෘත්තීයභාවය** - උසස් තත්වයේ සේවාවක් සැපයීමේ අභිමානය අප සතුවේ.

**සුපිළිපන්භාවය** - අප අවංක සහ සදාචාරාත්මක හැසීරිම දිරිමත් කරන්නෙමු.

**වගකීම** - අප කරන කාර්යයන්හි වගකීම අපි, භාරගන්නෙමු.

**විනිවිදභාවය** -අපි විවෘතභාවය සහ පුරෝකථනය කිරීමේ හැකියාව පවත්වා ගන්නෙමු.

**නව්‍යකරණය** - අපි අළුත් දේ සොයා යන්නෙමු.

**සාමූහික ප්‍රයත්නය** - අපි එකමුතුකමේ බලය විශ්වාස කරන්නෙමු.



# වත්මන් තත්ත්වය සහ අභියෝග

ශ්‍රී ලංකා රේගුවේ ආරම්භය 1806 දක්වා දිවෙන අතර, ක්‍රිස්තු පූර්ව දෙවන සියවසේ පටන් විදේශීය යාත්‍රා වලින් රේගු බදු එකතු කිරීමේ රේගු ඉතිහාසය පැහැදිලි පුරාවිද්‍යාත්මක සාක්ෂි මගින් අනාවරණයවේ. වර්තමානයේ, ශ්‍රී ලංකාවේ පවත්නා ආර්ථික අර්බුදය හමුවේ රජයට බදු ආදායම එකතු කරන වඩාත් වැදගත් දෙපාර්තමේන්තු වලින් එකක් ලෙස ශ්‍රී ලංකා රේගුව ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. 2022 වසරේදී දැඩි ආනයන සීමාවන් යටතේ වුවද රජයේ සමස්ත ආදායමෙන් 35% ක් නියෝජනය කරමින්, ආසන්න වශයෙන් බදු ආදායමින් 40% ක් එකතු කිරීම මඟින් ශ්‍රී ලංකා රේගුව බදු ආදායම එකතු කිරීම සඳහා කැපී පෙනෙන අයුරින් දායක වී ඇත.

### ආයතනය තුළ බලතල පවත්වා ගැනීම

අභියෝගාත්මක කාල සීමාවන් ඔස්සේ ශ්‍රී ලංකා රේගුව සාර්ථත්වය කරා මෙහෙයවීමේදී දක්ෂ සහ සුදුසුකම්ලත් මානව සම්පත් අත්‍යාවශ්‍ය සාධකයකි. COVID-19 වසංගතය කාලසීමාව තුළ වෙළඳාම සඳහා නම්‍යශීලි ක්‍රියාමාර්ගයන්ට අනුගත වූ කාර්යමණ්ඩල සාමාජිකයින්ගේ කැපවීම හේතුවෙන් බාධාවකින් තොරව සිය කාර්යයන් ඉටුකරනු ලැබීය. රේගු නිලධාරීන් විසින් ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව පවත්වාගෙන යනු ලබනවා පමණක් නොව, ස්වංක්‍රීය පද්ධතිය වැඩිදියුණු කිරීම සහ ඒ සඳහා නව තාක්ෂණයන් හඳුන්වාදීම සිදුකෙරේ. ඔවුන් විසින් භාණ්ඩ නිශ්කාෂණය සඳහා අවදානම්පාදක වරණීය පද්ධතියක් (Risk Based Selectivity Mechanism) වැඩිදියුණුකර ඇති අතර මෙම අවදානම් කළමනාකරණ පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා බොහෝ නිලධාරීන් ක්‍රියාකාරි ලෙස සම්බන්ධ වේ. රේගු පරිපාලනය සඳහා ප්‍රමිතීන් ස්ථාපනය කිරීම සඳහා කමිටු රැස්වීම් සහ සම්මන්ත්‍රණයන්ට සහභාගිවෙමින්, ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් විසින් ලෝක රේගු සංවිධානය (WCO) සහ ලෝක වෙළඳ සංවිධානය (WTO) වැනි ජාත්‍යන්තර සංවිධාන සඳහා සිය දැනුම සහ පළපුරුද්ද ලබා දේ. තවද, ලෝක රේගු සංවිධානය විසින් රේගුවේ විවිධ ක්ෂේත්‍ර සඳහා විශේෂඥයින් ලෙස බලයලත් නිලධාරීන්, අනෙකුත් රටවල නිලධාරීන් පුහුණු කිරීමේ ජාත්‍යන්තර දූත මෙහෙයන් සඳහා ද සහභාගි වේ. ශ්‍රී ලංකා රේගුවේ මැනවින් ස්ථාපනය කරන ලද නෛතික රාමුව මගින් නීති විරෝධී ක්‍රියා මැඩලීමේදී පමණක් නොව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් ආරක්ෂා කිරීම සඳහා ද අවශ්‍ය බලතල ලබාදේ. රේගු ආඥා පනත මූලිකව 1869 දී ස්ථාපනය කරන ලද නමුත් වර්තමානයේ දී, කාලීනව පරීක්ෂා කරන ලද ලේඛණයක් බවට පත්වෙමින්, කාලීන අවශ්‍යතාවන්ට විසඳුම් ලබාදීම සඳහා එයට සංශෝධන 51ක් සිදුකර ඇත. ආයතනික පහසුකම් සහ නිලධාරීන්ගේ ධාරිතාවන් වැඩිදියුණු කිරීම සඳහා දායක වෙමින් දෙපාර්තමේන්තුවේ සහ එහි නිලධාරීන්ගේ ප්‍රතිලාභ සඳහා අරමුදල් පවත්වා ගැනීම සඳහා එමඟින් ඉඩ සැළසේ. තවද, නිලධාරීන් මූල්‍යමය වශයෙන් පිළිගැනීමට ලක්කිරීම සහ අභිප්‍රේරණය කිරීමේ එකම අරමුණින් රේගු ආඥා පනත යටතේ ත්‍යාග යෝජනා ක්‍රමයක්ද හඳුන්වා දී ඇත.

### නව්‍යකරණ පරිවර්තනය

සිය ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රාජ්‍ය ආයතන වලින් එකක් වශයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් 1992 දී සිය කාර්යයන් සඳහා ASYCUDA පද්ධතිය ක්‍රියාත්මක කරනු ලැබූ අතර, එතැන් සිට එය ASYCUDA ගෝලීය පද්ධතිය (ASYCUDA WORLD) දක්වා වැඩිදියුණු කරනු ලැබ ඇත. COVID-19 වසංගත කාලයේදී එම අවදානම් තත්වය යටතේ කටයුතු කිරීම සඳහා ස්වයංක්‍රීයකරණය ක්‍රියාවලිය වේගවත් කරනු ලැබීය. මෙම කාලසීමාව තුළ, ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන (ICT) අංශය, රේගු ලේඛණ ඉලෙක්ට්‍රොනිකව ඉදිරිපත් කිරීම ක්‍රියාත්මක කිරීම, ඩිජිටල් අත්සන් භාවිතය, වෙළඳුන්ට සිය රේගු සටහන්කරවල තත්වය පිළිබඳව දැනුම්දීම සඳහා SMS දැනුම්දීමේ පද්ධතිය, ප්‍රේෂණ කළමනාකරණ පද්ධතියක් ඇතුළු කැපී පෙනෙන නව්‍යතා ළඟාකර ගෙන ඇත.

අවසානයේ පාර්ශවකරුවන්ට කාලය සහ පිරිවැය ඉතිරි කරමින් රේගු ලේඛන අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය, ශ්‍රී ලංකා රේගුවේ ආසිකුඩා පද්ධතිය (SLC ASYCUDA system) අනෙකුත් රාජ්‍ය නියෝජිතායතන (OGAs) සමඟ සාර්ථකව ඒකාබද්ධ කරනු ලැබීය. මේ වන විට රාජ්‍ය ආයතන 18ක් ආසිකුඩා පද්ධතිය සමඟ සම්බන්ධවී ඇත. ඊට අමතරව ගුවන් තොටුපොළේ ඇති බදු නිදහස් (Duty Free) සාප්පුවල බදු සහන අධීක්ෂණය කිරීම සඳහා ස්වයංක්‍රීය පද්ධතියක් හඳුන්වා දී ඇත. රේගුවේ තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ සියළු ව්‍යාපෘති සහ ක්‍රියාවලි ශ්‍රී ලංකා රේගුවේ ICT සැලසුමේ විධිමත්ව ඇතුලත්කර ඇත.

## සමාජය, ජෛව විවිධත්වය සහ ජාතික උරුමය ආරක්ෂා කිරීම

ගොඩබිම මෙන්ම සාගරයේ ජෛව විවිධත්වයෙන් පොහොසත් ශ්‍රී ලංකාව, තර්ජනයට ලක්වූ ජෛව විවිධත්ව විශේෂයන්ගෙන් අනූනය. දේශසීමාවන්හිදී ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමේ වැදගත්කම අවබෝධ කරගනිමින්, ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම සඳහාම කැපවූ එකී විශේෂ ඒකකය ස්ථාපනය කරන ලද ලොව පළමු රේගු පරිපාලනය බවට පත්වෙමින් 1993 දී ශ්‍රී ලංකා රේගුව ජෛව විවිධත්ව ආරක්ෂණ ඒකකය පිහිටුවනු ලැබීය. සංස්කෘතික වටිනාකම් සහ ජාතික උරුමයන් ආරක්ෂා කිරීම එක්කරමින්, එම ඒකකය, මේ වන විට ජෛව විවිධත්ව, සංස්කෘතික සහ ජාතික උරුමයන් ආරක්ෂා කිරීමේ ශාඛාව (BCNP) ලෙස පුළුල් කර තිබේ.

ශ්‍රී ලංකා රේගුව, ජාතික නීති සහ ජාත්‍යන්තර පාරිසරික ගිවිසුම් වලට අනුගතවීම තහවුරු කරමින් ආනයනය, අපනයනය, නැවකින් නැවකට මාරුකිරීම සහ භාණ්ඩ හුවමාරු කිරීමේදී ජාත්‍යන්තර වෙළඳාම ඔස්සේ පාරිසරික නියාමන අනුකූලතාවන් අනුව කටයුතු කරයි. පාරිසරික වශයෙන් සංවේදී අයිතම, නීතිවිරෝධී වෙළඳාම වැළැක්වීම කෙරෙහි අවධානය යොමුකරමින් භාණ්ඩ ගමනාගමනය හා සම්බන්ධ පාරිසරික අවදානම් අඩුකිරීම සඳහා කළමනාකරණ තාක්ෂණයන් යොදාගනී. වනජීවී ආරක්ෂක නියෝජිතායතන සහ ජාත්‍යන්තර සංවිධානවල සහයෝගීතාවය ඇතිව, නීති විරෝධී වනජීවී ජාවාරම් මැඩලමින් වනජීවීන් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව දායකවේ. ඊට අමතරව, ශ්‍රී ලංකා රේගුව ඉලෙක්ට්‍රොනිකව ලේඛණ ඉදිරිපත් කිරීම හා අවදානම ඇගයීමේ පද්ධති වැනි නවීන තාක්ෂණයන් ක්‍රියාත්මක කරමින් ක්‍රියාකාරී ලෙස හරිත තාක්ෂණයන් භාවිතය දිරිමත් කරයි. තවද, වෙනත් රටවල රේගු පරිපාලනයන්, ජාත්‍යන්තර සංවිධාන සහ පාරිසරික නියෝජිතායතනවල සහයෝගීතාවය හරහා ශ්‍රී ලංකා රේගුව තොරතුරු සහ ප්‍රශස්ත ක්‍රියාමාර්ග හුවමාරු කරගනී.

ශ්‍රී ලංකා රේගුවේ පාරිභෝගික ආරක්ෂණ ඒකකය (CPU), විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිර්ණායකයන්ට අනුකූලව, දේශසීමාවන් හරහා ගමන් කරන භාණ්ඩ පාරිභෝගිකයන්ට සහ පරිසරයට ආරක්ෂාකාරීදැයි අධීක්ෂණය කරයි. එසේම, බුද්ධිමය දේපළ අයිතිය (IPR) ආරක්ෂා කිරීම සඳහා වන කාර්යාලය වශයෙන් ව්‍යාජකරණය සහ කොල්ලකෑමට එරෙහිව සටන් කරන අතර, දේශ සීමාවන් හරහා හානිකර අපද්‍රව්‍ය ගමන් කිරීම අධීක්ෂණය කරයි. ශ්‍රී ලංකා රේගුවේ පාරිභෝගික ආරක්ෂණ ඒකකය (CPU) පාරිසරික අපරාධ පිළිබඳව කටයුතු කරන අංශය ලෙස ක්‍රියාත්මක වේ. මත්ද්‍රව්‍ය පාලන ඒකකය (NCU) රටතුළට නීති විරෝධී ලෙස මත්ද්‍රව්‍ය ඇතුල්වීමේ භයානක යුද්ධයට එරෙහිව සටන් කරමින් ශ්‍රී ලංකාවේ දේශ සීමාවන් ආරක්ෂා කරයි. මත්ද්‍රව්‍ය පාලන ඒකකයේ කැපවූ කාර්යමණ්ඩලය පැසසිය යුතු මට්ටමින් අපේක්ෂිත කාර්යයන් ඉටුකරමින් රට තුළට ඇතුල්වන භාණ්ඩ සහ මගීන් දවසේ පැය 24 පුරා අධීක්ෂණය කරයි. රටවල් අතර අපරාධවලට එරෙහිව කටයුතු කිරීම සඳහා කැපවූ වරාය පාලන ඒකකය, මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) සහ WCO Cargo Border Team (PCBT) වැඩසටහනෙහි අරමුණු යටතේ ක්‍රියාකරමින් වරායන් සහ ගුවන්තොටුපළවල දී භාණ්ඩ සහ මගීන්ගේ ගමනාගමනය පාලනය කරයි.

## අනුකූල වෙළඳුන් සඳහා පහසුකම් සැළසීම

ශ්‍රී ලංකා රේගුව හඳුනාගත් අනුකූල වෙළඳුන් සඳහා පහසුකම් සැළසීම වෙනුවෙන් නීතිපාදක කළමනාකරණයේ සිට අවදානම්පාදක කළමනාකරණයේ ප්‍රවේශයක් වෙත යොමු වී ඇත. උදාහරණයක් ලෙස වර්තමානයේ අවදානම්පාදක තේරීම් ක්‍රියාවලිය මගින් භාණ්ඩ පරීක්ෂා කිරීම 73% සිට 42% දක්වා අඩුකර ඇත. තවද, ශ්‍රී ලංකා රේගුව විසින් බාධක රහිත රේගු ක්‍රියාවලියක් සපයමින් විශ්වාසදායක ආර්ථික මෙහෙයුම්කරුවන් සඳහා රේගු-ව්‍යාපාරික හවුල්කාරීත්ව වැඩසටහනක් හඳුන්වාදී ඇත. මූලික අවධියේදී විශ්වාසී ආර්ථික මෙහෙයුම්කරුවන් සඳහා අනුකූල ආර්ථික මෙහෙයුම්කරු (CEO) තත්වය පිරිනමන අතර ඔවුන් ඉහළ මට්ටමේ සැපයුම් ජාල ආරක්ෂක ප්‍රමිතීන් පවත්වාගෙන ගියවිට බලයලත් ආර්ථික මෙහෙයුම්කරු (AEO) තත්වයට උසස් කෙරේ. මෙම යෝජනාක්‍රම දෙක යටතේ වෙළඳුන්ට සිය භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීම් වලින් නිදහස් කිරීම ඇතුලු පහසුකම් ගණනාවක් හිමිවේ.

2021 වසරේදී ආනයනයන්හි වටිනාකම ආශ්‍රිත අවදානම් ඇගයීම සඳහා ආනයන මිල තක්සේරු දත්ත ගබඩාවක් සකස් කිරීම සඳහා, ජාතික ආනයන මිල තක්සේරු දත්ත ගබඩාවක් ස්ථාපනය කරනු ලැබීය. මෙම දත්ත ගබඩාව මගින් සැබෑ වෙළඳුන් සඳහා පහසුකම් සළසන අතරම සිය ආනයනයන් වැරදි ලෙස ලේඛනගත කරන ආනයනකරුවන් හඳුනා ගැනීමට ද උපකාරිවේ.




ශ්‍රී ලංකාව පාර්ශවකරුවකු වන ලෝක රේගු සංවිධානයේ "සංශෝධිත කියෝතෝ සම්මුතිය" මඟින් සරල නමුත් කාර්යක්ෂම ක්‍රියාවලියක් අදාලකර ගැනීම සම්බන්ධ නෛතික විධිවිධාන හරහා වෙළඳාම සඳහා පහසුකම් සැළසීම සහ ඵලදායි පාලනයන් ප්‍රවර්ධනය කෙරේ. 2016 වසරේදී, වෙළඳාම සඳහා පහසුකම් සැළසීම හා සම්බන්ධ සියලු විශේෂිත බැඳීම් ක්‍රියාත්මක කිරීමට කැපවෙමින් ලෝක වෙළඳ සංවිධානයේ "වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ගිවිසුම" පිළිගෙන ඇත. මේ වනවිට ශ්‍රී ලංකා රේගුව ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැළසී-මේ ගිවිසුමේ A සහ B කාණ්ඩයන්හි සියලු ක්‍රියාමාර්ගයක්ම පාහේ සම්පූර්ණකර තිබේ. මෙම ගිවිසුමෙහි ඇතුළත් C කාණ්ඩයේ නිර්දේශ ද සම්පූර්ණ කිරිමේ ප්‍රයත්නයන් මඟින් වෙළඳාමේ කාර්යක්ෂමතාව වැඩිකරමින් වෙළඳ ප්‍රජාව සඳහා තවත් පහසුකම් තහවුරු කෙරේ.

## ජාත්‍යන්තර ආයතන සමග සහයෝගීතාව

ලෝක රේගු සංවිධානය එහි සාමාජික රටවල් සඳහා නවීන ලෝකයේ යතාර්ථයන්ට මුහුණදීම සඳහා සුදුසු මෙවලම් කට්ටලයක් ලබාදේ. මේ සම්බන්ධයෙන් සැළකූවිට නව අවස්ථාවන්ට සහ අභියෝගයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා දැනට පවත්නා මෙවලම් යාවත්කාලීන කරමින්, නව මෙවලම් වැඩිදියුණු කිරීම සහ හඳුන්වාදීම සිදුකරයි. එමෙන්ම, ආයතනික පහසුකම් සැළසීම, ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම තොරතුරු සහ බුද්ධි තොරතුරු හුවමාරුකර ගැනීම මඟින් සාමාජික රේගු පරිපාලනයන් අතර සහයෝගීතාවය සහ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කෙරේ. ලෝක රේගු සංවිධානයේ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේදී, රේගු සහයෝගීතාවය ශක්තිමත් කිරීම සහ රේගුව නවීකරණය කිරීම සාමාජික රටවල් සඳහා ධාරිතා වර්ධන සහය සහ තාක්ෂණ සහය ලබාදීම ලෝක රේගු සංවිධානයේ තවත් වැදගත් කාර්යයකි. එබැවින්, 1967 සිට ලෝක රේගු සංවිධානයේ සාමාජිකයෙකු ලෙස සමීපව කටයුතු කිරීම නිසා ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ප්‍රශස්ත ක්‍රියාවලි අනුගත කර ගැනීම මඟින් ශ්‍රී ලංකා රේගුවට සිය පාර්ශවකරුවන්ට කාර්යක්ෂම සහ ඵලදායි සේවාවක් සැළසීමට හැකිවී ඇත. ඊට අමතරව ලෝක වෙළඳ සංවිධානය ශ්‍රී ලංකාව සාමාජිකත්වය දරන තවත් වැදගත් නියෝජිතායතනයක් වන අතර එමඟින් මූලිකව WTO-TFA වැනි වෙළඳාම ආශ්‍රිත ක්‍රියාමාර්ග හඳුන්වාදේ.

ශ්‍රී ලංකා රේගුවේ ස්වයංක්‍රීය පද්ධතිය වන ASYCUDA ගෝලීය පද්ධතිය, වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD) විසින් වැඩිදියුණු කරන ලද ඒකාබද්ධ රේගු කළමනාකරණ පද්ධතියකි. UNCTAD සහය ඇතිව මෙම පද්ධතිය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සිදු කර ඇත. ලෝක බැංකුව (WB), ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය (UNODC) ඇතුළු අනෙකුත් ජාත්‍යන්තර ආයතන ශ්‍රී ලංකා රේගුවේ මානව සම්පතෙහි තත්වය උසස් කිරීම සඳහා නිරන්තරයෙන් පුහුණු සහ වැඩමුළු සංවිධානයකර පවත්වයි. තවද, අන්‍යෝන්‍ය ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් (MOU) අත්සන් කිරීම හරහා ශ්‍රී ලංකා රේගුව සහ අනෙකුත් රේගු පරිපාලනයන් අතර සහයෝගීතාවය ශක්තිමත් කර ඇත.

# අභියෝග

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම එකතු කරන ප්‍රධාන දෙපාර්තමේන්තු වලින් එකක් ලෙස රටේ අනපේක්ෂිත ආර්ථික අර්බුදය මධ්‍යයේ රජය විසින් ලබාදෙන ආදායම් ඉලක්ක සපුරා ගැනීමේදී ශ්‍රී ලංකා රේගුවට පීඩනයක් ඇතිවේ.

ශ්‍රී ලංකා රේගුවේ දක්ෂ සහ නිපුණ කාර්ය මණ්ඩලය ආයතනය ඉදිරියට ගෙනයන වැදගත් සාධකය ලෙස හඳුනාගත හැකි නමුත් වඩාත් වෘත්තිය සහ නම්‍යශීලී කාර්යමණ්ඩලයක් බිහිකිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම සහ ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමේ අවශ්‍යතාවක් පවතී. මේ සම්බන්ධයෙන් සැළකීමේදී මානව සම්පත් සංවර්ධනය සඳහා නිසි යාන්ත්‍රණයක් ඇතිකිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ විද්‍යායතනයක් ඇතිකිරීම ප්‍රමුඛ අවශ්‍යතාවක්ව තිබේ.

දැනට පවතින ආර්ථික අර්බුදයට ප්‍රතිචාරයක් ලෙස සේවක බඳවා ගැනීම් සීමාකිරීමේ රජයේ ප්‍රතිපත්තිය හේතුවෙන් ආසන්න වශයෙන් අවශ්‍ය සේවක සංඛ්‍යාවෙන් තුනෙන් එකක් පමණ වන සැළකිය යුතු නිලධාරි සංඛ්‍යාවක අඩුවක් සමගින් කටයුතු කරයි. තවද, මෙම සීමිත කාර්ය මණ්ඩලය නිසි ආකාරයෙන් අනුයුක්ත නොකිරීම සහ දැනට පවතින ස්ථාන මාරු වැඩපිළිවෙල මෙම ගැටලුව තවත් උග්‍ර කරයි. කාර්යමණ්ඩලය තවදුරටත් අභිප්‍රේරණය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා කුසලතා පාදක උසස්වීමේ ක්‍රමවේදයක් සමඟින් නිලධාරීන් සඳහා ආකර්ශණීය වැටුප් සහ දිරිදීමනා යෝජනා ක්‍රමයක් අවශ්‍ය වේ.

රට සහ සමාජය වෙනුවෙන් අත්‍යාවශ්‍යය කාර්යභාරයක් ඉටුකලද, මාධ්‍ය මගින් විශේෂයෙන්ම සමාජ මාධ්‍ය මගින් පෙන්නුම් කරන පරිදි, ශ්‍රී ලංකා රේගුව පිළිබඳ මහජනයාගේ ප්‍රතිරූපය ධනාත්මත නොවේ. එබැවින් දුර්වලතා සඳහා විසඳුම් ලබාදෙමින් ධනාත්මක ප්‍රතිරූපයක් ගොඩනැංවීම ශ්‍රී ලංකා රේගුවට සැළකිය යුතු අභියෝගයක් ගෙන දේ.

ශ්‍රී ලංකා රේගුව තවමත් ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය වන සැපයුම් සේවාවන් සහ යටිතල පහසුකම් හිඟයකට මුහුණදේ. සුහුරු තාක්ෂණය සහිත භාණ්ඩ පරීක්ෂා කිරීමේ පහසුකම, ප්‍රතීතකරණය කරන ලද රේගු විද්‍යාගාරය සහ ශ්‍රී ලංකා රේගුවේ අංශ අතර සුදුසු අභ්‍යන්තර සන්නිවේදන පද්ධතියක් හඳුනාගත් අවශ්‍යතාවන් අතර වේ.

පර්යේෂණ සිදුකිරීම සඳහාම වූ අංශයක් ශ්‍රී ලංකා රේගුව සතුව ඇති නමුත් කරුණු මත පදනම් තීරණ ගැනීමේදී සහ ප්‍රතිපත්ති සම්පාදනයේදී ප්‍රයෝජනවත් විය හැකි පර්යේෂණ සිදුනොවේ.

# ඉදිරි ගමන: සාර්ථකත්වය සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම

වර්තමානයේ ශ්‍රී ලංකාව නිදහස ලැබීමෙන් පසු මුහුණ දුන් වඩාත්ම දරුණු ආර්ථික අර්බුදය අත්විඳිමින් සිටී. රජයට ආදායම් උත්පාදනය කරන එක් මූලික ආයතනයක් වශයෙන් මේ සඳහා සැළකිය යුතු දායකත්වයක් ලබාදීම ශ්‍රී ලංකා රේගුවේ අපේක්ෂාව වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා රේගුව සඳහා වන උපායමාර්ගික සැලැස්ම මූලිකවම නුදුරු අනාගතයේදී මෙරට ආර්ථික අර්බුදයෙන් මුදාගැනීම සඳහා වන රජයේ අපේක්ෂාවන් සඳහා උපකාරීවීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

ඒ අනුව, රජයට ආදායම ලැබීම වැළැක්වීමේ මාර්ග අවුරමින් කාර්යක්ෂම සහ ඵලදායි ලෙස රජයට ලැබිය යුතු ආදායම සුරක්ෂිත කිරීම වැදගත්ය. ආනයන සහ අපනයනය යන දෙකෙහිම පරිමාව පුළුල් කිරීම සඳහා බාධක රහිත වෙළඳ ප්‍රවාහය තහවුරු කළ යුතුය. මේ සම්බන්ධයෙන් ක්‍රියාවලි ක්‍රමවත් කිරීම සහ නව ක්‍රියාමාර්ග සහ ප්‍රශස්ත ක්‍රියාවලි හඳුන්වාදීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා රේගුව සඳහා වෙනස්කම් සිදුකිරීම සහ නව ක්‍රියාමාර්ග එක්කිරීම ලෝක රේගු සංවිධානයේ සංශෝධිත කියෝතෝ සම්මුතිය (WCO-RKC) සහ ලෝක වෙලඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ගිවිසුමෙහි (WTO-TFA) විස්තර කර ඇති ප්‍රමිතීන්ට සහ බැඳීම් වලට අනුකූල විය යුතුය.

ශ්‍රී ලංකා රේගුවේ අනාගතය සැලසුම් කිරීම පිණිස උපායමාර්ග සැලසුම් කිරීම සඳහා ශ්‍රී ලංකා ආර්ථිකය ප්‍රතිව්‍යූහගත කිරීමේදී ප්‍රධාන භූමිකාවක් ඉටුකරන IMF කණ්ඩායම විසින් ලබාදුන් නිර්දේශ සළකා බැලීම අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස කාර්යමණ්ඩලය අතර ඇතිවන සුපිළිපන්භාවය පිළිබඳ ගැටලු පිළිබඳව කටයුතු කිරීම සඳ හා ශ්‍රී ලංකා රේගුව තුළ ජාත්‍යන්තර සබඳතා ඒකකයක් ස්ථාපනය කිරීම ඔවුන්ගේ මූලික නිර්දේශයක් වේ.

ජාත්‍යන්තර වෙළඳාමේ ගතිකතාව හඳුනාගැනීම ශ්‍රී ලංකා රේගුවේ අනාගත ගමන්මග තීරණය කරන තවත් වැදගත් සාධකයකි. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකීය වෙළඳාම සඳහා ඊ වාණිජ්‍ය ප්‍රවේශය සහ ඒ හා සමාන ප්‍රවණතාවන් සැළකිය යුතුය. ඊට අමතරව, ජාත්‍යන්තර වෙළඳාම සඳහා තර්ජනයක් ලෙස නැගී එන වෙළඳාම පාදක මුදල් විශුද්ධිකරණය කෙරෙහි රේගුවේ අවධානය යොමුවීම අවශ්‍ය වේ.

2024 වසරේදී ශ්‍රී ලංකා රේගුව UNCTAD තාක්ෂණ සහය සමගින් ජර්මන් රජය විසින් මූල්‍යාධාර සපයන ලද ගෝලීය සමුද්‍රීය වෙළඳාම ඩිජිටල්කරණය කිරීම (Digitalizing Global Maritime Trade) යටතේ තවත් වැදගත් ව්‍යාපෘතියක් වන ASYHUB පද්ධතිය දියත් කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම මගින් නැව් භාණ්ඩ මෙරටට ලඟාවීමට පෙර අවදානම්පාදක සැකසුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ඉක්මන් භාණ්ඩ නිශ්කාෂණය සහ වෙළඳ පිරිවැය අඩුකිරීම ශ්‍රී ලංකා රේගුවේ අපේක්ෂාව වේ. නිශ්කාෂණ කාලය අඩුකිරීම සහ භාවිතාකරන්නන් සඳහා වැඩිදියුණු කළ සේවාවන් සැපයීම සඳහා සුහුරු තාක්ෂණය සමගින් බහාලුම් පරීක්ෂා කිරීමේ පහසුකම් සහිත ආසියානු සංවර්ධන බැංකුව විසින් ආධාර සපයන යෝජිත කෙරවලපිටිය රේගු පිරික්සුම් මධ්‍යස්ථානය ඉදිකිරීම ශ්‍රී ලංකා රේගුව සඳහා තවත් ප්‍රමුඛ ජයග්‍රහණයක් වනු ඇත.

ශ්‍රී ලංකා රේගුවේ මූලික කාර්යයන් සහ අරමුණු මත පදනම්ව ඉදිරි වසර පහ සඳහා උපාය මාර්ග සැලසුම් කිරීමේදී ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් හඳුනාගෙන ඇත; ආදායම, පාරිසරික-සමාජීය ආරක්ෂාව සහ වෙළඳාම සඳහා පහසුකම් සැළසීම. ශ්‍රී ලංකා රේගුව ආයතනයක් ලෙස නැවත ගොඩනැගීමේ වැදගත්කම හඳුනා ගනිමින්, හතරවන ප්‍රධාන ක්ෂේත්‍රය වශයෙන් ආයතනික සංවර්ධනය ඇතුලත්කර ඇත. මෙම වසර පහක උපායමාර්ගික සැලසුම රේගුවේ මූලික අභිමතාර්ථ හතර ළඟාකර ගැනීම සඳහා වන ඉලක්ක සහ උපායමාර්ග හුවාදක්වමින් ඒ වටා ගොඩනැගී ඇත.




# ඉලක්කගත ක්ෂේත්‍රය 1: ආදායම

ආදායම එකතු කිරීම ඕනෑම රේගු පරිපාලනයක පොදු අරමුණවේ. රටේ පවතින ආර්ථික අර්බුදය මධ්‍යයේ වුවද රාජ්‍ය ආදායම සඳහා සැළකිය යුතු දායකත්වය ලබා දෙන ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා රේගුව අද්විතීය වැදගත්කමක් ලබාගෙන ඇත. විශේෂයෙන්ම මූල්‍ය අර්බුදයක් පවතින කාලයන්හි රජය, රේගුව වැනි ආදායම් උත්පාදනය කරන දෙපාර්තමේන්තු කෙරෙහි වැඩි අපේක්ෂාවක් තබාගනී. රජය විසින් අපේක්ෂිත ආදායම් ඉලක්ක ළඟාකර ගැනීම සඳහා ක්‍රියාශීලිව ආදායම් උත්පාදනය කිරීමේ නව මාවත් සොයාබලන අතර, ශ්‍රී ලංකා රේගුව විසින් ලැබිය යුතු ආදායම එකතු කිරීම සාක්ෂාත් කිරීමේ ප්‍රයත්නයන් වැඩිදියුණු කළ යුතුය.

### 1 වන අභිමතාර්ථය : ආදායම් උපරිමකරණය

### අරමුණු:

1.1 ලැබිය යුතු ආදායම එකතු කිරීම

1.2 ආදායම අභිමිවීම වැළැක්වීම

1.3 නව මාවත් සොයායාම

## 1.1 ලැබිය යුතු ආදායම එකතු කිරීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| උසස් අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම. | වැඩිදියුණු කරන ලද අනුකූලතා මට්ටම් |
| නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය. | නිපුණ ශ්‍රම බලකාය |
| භාණ්ඩ වර්ගීකරණය, මිල පිරික්සුම සහ භාණ්ඩ සම්භවය සඳහා පූර්ව තීරණ ලබා දීම. | වෙළඳුන්ගේ වැඩිදියුණු වූ අනුකූලතා මටට්ම |
| ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම. | මානව මැදිහත්වීම අවම කිරීම |
| භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා නවීන තාක්ෂණයන් භාවිතා කිරීම | කාර්යක්ෂම සහ ඵලදායී භාණ්ඩ පරීක්ෂා කිරීම |
| රේගු නිශ්කාෂණ ලේඛණ වල වලංගුභාවය තහවුරු කිරීම. | නිශ්කාෂණ ලේඛණ වල ඉහළ නැංවූ නිරවද්‍යතාව |
| යාවත්කාලීන කරන ලද ASYCUDA දත්ත ගබඩාවක් පැවතීම තහවුරු කිරීම. | ලැබිය යුතු බදු ආදායම නියමිත වෙලාවට එකතු කිරීම |
| පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය ශක්තිමත් කිරීම. | ශක්තිමක් වූ සහයෝගීතාවක් |

## 1.2 බදු ආදායම අහිමිවීම වැළැක්වීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| ප්‍රතිපත්ති සම්පාදනය සඳහා නිර්දේශ ලබාදීම. | නව ප්‍රතිපත්ති ආරම්භ කිරීම |
| රේගු පාලන යාන්ත්‍රණ ශක්තිමත් කිරීම. | වැඩි දියුණු වූ අනුකූලතා මට්ටම් |
| පශ්චාද් නිශ්කාෂණ විගණන පාලනයන් ශක්තිමත් කිරීම. | වැඩි දියුණු වූ අනුකූලතා මට්ටම |
| සෝදිසි කිරීමේ සහ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම. | නීති උල්ලංඝනය කිරීම්/ අක්‍රමිකතා අඩුකිරීම |
| සිදුවියහැකි දූෂණ ක්‍රියා වැළැක්වීම. | වැඩිදියුණුවූ සුපිළිපන් මට්ටම් |
| නියෝජිතායතන අතර සහයෝගීතාවය ශක්තිමක් කිරීම. | සාර්ථක ලෙස සිදුකරන ලද මෙහෙයුම් |

## 1.3 නව මාවත් සොයා යාම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| කාර්යක්ෂම සහ ඵලදායී ඊ වාණිජ්‍ය නිශ්කාෂණයක් සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම. | ස්ථාපනය වු වෙළඳුන්ගේ එකතුවක් සහිත මොඩලයක් |
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග දත්ත හුවමාරුව හරහා හුවමාරු මිලකරණ (transfer pricing) ගැටලු සඳහා විසඳුම් ලබාදීම. | භාණ්ඩ හුවමාරුවේදී මිලකිරීමේ වංචා අඩුකිරීම |
| පර්යේෂණ සහ සංවර්ධන වැඩිදියුණු කිරීම. | නව පර්යේෂණ පදනම් දැනුම |
| රාජසනතක කරන ලද භාණ්ඩ අපහරණ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම. | ස්ථාපනය වූ ඉලෙක්ට්‍රොනික ලංසු ක්‍රමවේදයක් |



# ඉලක්කගත ක්ෂේත්‍රය 2: වෙළඳාම සඳහා පහසුකම් සැළසීම

වෙළඳ බාධක ඉවත් කිරීම මඟින් වෙළඳ පරිමාව පුළුල් කිරීම ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යා-වශ්‍ය සාධකයක් වේ. වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීමට සහ ධනාත්මක වර්ධනයක් කරා ගමන් කිරීම සඳහා WCO-RKC සහ WTO-TFA වැනි ජාත්‍යන්තර සම්මුතීන්හි සඳහන් ප්‍රමිතීන්ට අනුව ක්‍රියාමාර්ග ගැනීම, වෙළඳාම සඳහා පහසුකම් සැළසීම අවශ්‍යයෙන් හඳුනාගත හැක. එසේම, අවදානම් කළමනාකරණ මූලධර්ම යොදාගැනීම, අනුකූල නොවන වෙළඳුන් පිළිබඳව විශේෂයෙන් සළකාබලා අනුකූල වෙළඳුන්ට පහසුකම් සැළසීමේ හැකියාව ලබාදෙමින්, අනුකූල සහ අනනුකූල වෙළඳුන් වෙන්කර හඳුනා ගත යුතුය. මෙම උපායමාර්ගික ප්‍රවේශය මගින් වෙළඳ ක්‍රියාවලින් ක්‍රමවත් කිරීම පමණක් නොව තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා හිතකර පරිසරයක් දිරිමත් කරයි.

### 2 වන අභිමතාර්ථය : නීත්‍යානුකූල වෙළඳාම සඳහා පහසුකම් සැළසීම.

### අරමුණු:

2.1 වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම

2.2 වෙළඳාම සඳහා පහසුකම් සැළසීමේ රජයේ ප්‍රතිපත්ති ඵලදායි සහ කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම

2.3 අනුකූල නොවන වෙළඳාම වැළැක්වීම

## 2.1 වෙළඳාම සඳහා පහසුකම් සැළසීම පිළිබඳ ජාත්‍යන්තර බැඳීම් ක්‍රියාත්මක කිරීම සහ ඊට අනුකූලවීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| දැනට පවත්නා නීති සඳහා අදාල සංශෝධන යෝජනා කිරීම. | ශක්තිමත් නීතිමය රාමුව |
| ජාතික තනි කවුළුව (National Single Window) සඳහා සහය වීම. | ස්ථාපනය කරන ලද ජාතික තනි කවුළුව |
| භාණ්ඩ මෙරටට ලඟාවීමට පෙර රේගු ලේඛණ සකස් කිරීම හඳුන්වා දීම. | සම්පූර්ණ කරන ලද ASYHUB ව්‍යාපෘතිය |
| වෙළඳුන්, අනෙකුත් රේගු පරිපාලනයන් සහ අනෙකුත් රාජ්‍ය නියෝජිතායතන (OGAs) සමග සහයෝගී වීම. | ස්ථාපනය කරන ලද තොරතුරු හුවමාරු කිරීමේ වේදිකා |
| පශ්චාද් නිෂ්කාශන විගණන (PCA) පාලනයන් | වැඩිදියුණු කරන ලද නිෂ්කාශන කාර්යක්ෂමතාව |
| ජාත්‍යන්තර බැඳීම් අධීක්ෂණය සහ සමාලෝචනය සඳහා යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම. | ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූලවීම |
| AEO/CEO පදනම පුළුල් කිරීම | පුළුල් වූ AEO/CEO පදනම |
| රේගුව සම්බන්ධයෙන් දැනට ක්‍රියාක්මක කළ යුතුව ඇති WTO-TFA නිර්දේශ ක්‍රියාත්මක කිරීම. | සම්පූර්ණයෙන් ක්‍රියාත්මක WTO-TFA |
| වෙළඳාම සඳහා පහසුකම් සැළසීමට අදාල WCO මෙවලම් ක්‍රියාත්මක කිරීම. | ක්‍රියාත්මක කරන ලද WCO මෙවලම් |

## 2.2 වෙළඳාම සඳහා පහසුකම් සැළසීම පිළිබඳ රජයේ ප්‍රතිපත්ති කාර්යක්ෂම සහ ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| ක්‍රියාවලි සරල කිරීම සහ ප්‍රමිති කිරීම. | වැඩිදියුණු කරන ලද විනිවිදභාවය සහ ඒකීයත්වය |
| වැඩිදියුණු කරන ලද තාක්ෂණයන් සහ ස්වයංක්‍රියකරණය  හඳුන්වාදීම. | අඩුකරන ලද මානව මැදිහත්වීම් සහ කඩදාසි ලේඛන |
| රේගු-ව්‍යාපාරික හවුල්කාරීත්ව වැඩසටහන් ඇති කිරීම. | වැඩිදියුණු කරන ලද වෙළඳාම සඳහා පහසුකම් සැළසීම |

## 2.3 අනුකූල නොවන වෙළඳාම වැළැක්වීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| නීති බලාත්මක කිරීම සහ පාලනයන් ශක්තිමත් කිරීම. | වැඩිදියුණු වූ අනුකූලතා මට්ටම් |
| පාර්ශවකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | වැඩිදියුණු වූ දැනුවත් අනුකූලතාවන් |
| වාර්තා කිරීම සහ සමාලෝචනය සමග දැඩිව එකට එක්වූ ප්‍රමාණවත් සහ ස්ථාවර වැරදි වැළැක්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම. | වැඩිදියුණු වූ ආර්ථික සාධාරණත්වය |



# ඉලක්කගත ක්ෂේත්‍රය 3: පාරිසරික-සාමාජීය ආරක්ෂාව

“පාරිසරික-සාමාජීය ආරක්ෂාව”, පාරිසරික තිරසාරත්වය සහ සමාජ ආරක්ෂාව යන දෙක එක්කරන ඒකාබද්ධ ප්‍රවේශයකි. එමගින් පාරිසරික සහ සමාජීය කරුණු එකිනෙක මත රඳාපැවැත්ම හඳුනා ගැනෙන අතර පාරිසරික අභියෝගයන් සහ සමාජීය සුභසිද්ධිය යන දෙකම සඳහා එකවර විසඳුම් ලබාදෙන ප්‍රතිපත්ති සහ වැඩසටහන් වැඩිදියුණු කිරීම සොයා බැලේ. පාරිසරික හායනය සහ සමාජ ගැටලු නිරන්තරයෙන් එකිනෙක සම්බන්ධ වන බව මෙම සංකල්පය මඟින් පිළිගන්නා අතරම දිගු කාලීන තිරසාරත්වය සඳහා වන විසඳුම් වලදී මෙම අංශ දෙකම පිළිබඳව සළකා බැලීම අවශ්‍ය වේ.

### 3 වන අභිමතාර්ථය : දේශසීමා හරහා කාර්යක්ෂම පාලනය මගින් ජනතාව සහ පරිසරය ආරක්ෂා කිරීම

### අරමුණු:

3.1 රටවල් අතර දේශසීමාවන් හරහා සිදුවන අපරාධ සහ වැරදි වැළැක්වීම

3.2 ජාත්‍යන්තර ගිවිසුම් සහ ජාතික ප්‍රමිතීන් කෙරේ අනුකූලතාවය වැඩිදියුණු කිරීම

3.3 දේශීය සහ විදේශීය දේශසීමා නියාමන නියෝජිතායතන සමග සබඳතාවන් වැඩිදියුණු කිරීම

3.4 පාරිසරික-සමාජ ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම

## 3.1 රටවල් අතර දේශසීමාවන් හරහා සිදුවන අපරාධ සහ වැරදි වැළැක්වීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිපල |
|---|---|
| දේශසීමා හරහා සිදුවන අපරාධ පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම සහ සංවර්ධනය කිරීම. | දක්ෂ දේශසීමා පාලන නිලධාරීන් |
| දේශසීමාවන් හරහා අවදානම් සහ තර්ජන අනාවරණ කරගැනීම, වැළැක්වීම, බාධාකිරීම සහ වාර්තා කිරීම. | අවම වූ වංචා සහ අපරාධ |
| වෙළඳාම පාදක මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මූල්‍යයනය හා අදාල FATF (Financial Action Task Force) ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම. | සැකසහිත ගනුදෙනු පිළිබඳව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම සහ වැරදි පිළිබඳ දත්ත මූල්‍ය බුද්ධි ඒකක සමග හුවමාරු කිරීම සඳහා ස්ථාපනය වූ පද්ධතියක් |
| අති නවීන තාක්ෂණයන් සහ ප්‍රශස්ත ක්‍රියාවලි භාවිතා කිරීම. | වැඩිදියුණු වූ අනාවරණය කරගැනීම් සහ කාර්යක්ෂමතාවය |
| සමාජ සහ පාරිසරික දාෂ්ඨීන් අන්තර්ගත කිරීම සඳහා අවදානම් කළමනාකරණ පද්ධති (RMS) ඇතුළුව දැනට පවත්නා සියලු ක්‍රියාවලි නවීකරණය කිරීම. | වැඩිදියුණු වූ අනාවරණයන් සහ කාර්යක්ෂමතාවය |
| අනෙකුත් රාජ්‍ය නියෝජිතායතන (OGAs) සමග නිසි වෙලාවට තොරතුරු හුවමාරු කරගැනීම සඳහා වේදිකාවක් වැඩිදියුණු කිරීම. | වැඩිදියුණුවූ කාර්යක්ෂම ඒකාබද්ධ මෙහෙයුම් |

## 3.2 බහුපාර්ශික ගිවිසුම් සහ ජාතික ප්‍රමිතීන් සමග අනුකූලතාව වැඩිදියුණු කිරීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| දැනට පවතින නෛතික සහ නියාමන රාමුව අනුව කටයුතු කිරීම. | එකිනෙක හා සම්බන්ධ නෛතික හා නියාමන රාමුව |
| දැනට පවතින බහුපාර්ශවීය ගිවිසුම් සහ ප්‍රමිතින් පිළිබඳව නිලධාරීන්ගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම. | වැඩිදියුණු වූ දැනුවත්භාවය |
| සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක (SPS) ක්‍රියාමාර්ග සඵලදායි ලෙස බලාත්මක කිරීම. | වැඩිදියුණු වූ ජෛව ආරක්ෂාව |

## 3.3 දේශීය සහ විදේශීය දේශසීමා නියාමන නියෙජිතායතන සමග සබඳතා වැඩිදියුණු කිරීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| රේගු අනෝන්‍ය සහාය ගිවිසුම් (CMAAs) සකස් කිරීම. | වැඩිදියුණු වූ සහයෝගිතාවය සහ දැනුම බෙදාගැනීම |
| ජාතික සහ අන්තර්ජාතික ධාරිතා වර්ධන වැඩසටහන් හරහා සබඳතා වැඩිදියුණු කිරීම. | ශක්තිමත් වූ ජාතික සහ අන්තර්ජාතික සහයෝගීතාවන් |

## 3.4 පාරිසරික සමාජීය ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය ප්‍රවර්ධනය කිරීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| කලින් කලට මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රජා සහභාගිත්ව වැඩසටහන් පැවැත්වීම. | වැඩිදියුණුවූ මහජන දැනුවත්භාවය |
| රාජ්‍ය පෞද්ගලික සහයෝගීතාවන් ක්‍රියාත්මක කිරීම. | හොඳින් දැනුවත්වූ මහජනයා |
| පුරවැසි වාර්තා කිරීම් යාන්ත්‍රණයක් හඳුන්වාදීම. | පුළුල් වූ තොරතුරු ජාලයක් |
| මහජනයා සඳහා වන ත්‍යාග සහ පිළිගැනීම් වැඩිකිරීම. | වැඩිදියුණු වූ මහජන සහභාගිත්වය |



# ඉලක්කගත ක්ෂේත්‍රය 4: ආයතනික සංවර්ධනය

මෙහෙයුම් ක්‍රියාවලිය ප්‍රශස්තකරණය හා කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සහ ඵලදායි සම්පත් කළමනාකරණය තහවුරු කිරීම සමග ශ්‍රී ලංකා රේගුවේ ආයතනික සංවර්ධනය අත්‍යාවශ්‍යයෙන්ම සිදුකළ යුතුව ඇත. ආයතනික සංවර්ධනය කෙරෙහි අවධානය යොමුකිරීමේදී මෙම උපායමාර්ගික සැලසුමෙහි දක්වා ඇති අභිමතාර්ථ ලඟාකර ගැනීම සඳහා අයතනයේ ධාරිතාව ගොඩනැගීම ශ්‍රී ලංකා රේගුවේ අරමුණවේ. උපායමාර්ග, සැකැස්ම සහ ක්‍රියාවලි සංවර්ධනය, වැඩිදියුණු කිරීම සහ සවිගැන්වීම මෙයට අයත්ය. ඉහළ දක්ෂතාවක් සහ සදාචාරාත්මක හැසිරීමක් ඇති මානව සම්පත ශ්‍රී ලංකා රේගුවේ සාර්ථකත්වය සඳහා තීරණාත්මක සාධකයන් වන බැවින්, විශේෂයෙන්ම නිලධාරීන්ගේ ආකල්ප වෙනස් කිරීම සහ ඔවුන්ගේ සුපිළිපන්භාවය ප්‍රවර්ධනය කිරීම මගින් මානව සම්පතෙහි ධාරිතාවන් තවදුරටත් ශක්තිමත් කිරීම මෙහිදී වැදගත් වේ.

### 4 වන අභිමතාර්ථය : විශිෂ්ඨත්වය ළඟාකර ගැනීම සඳහා ආයතනික පරිවර්තනය

### අරමුණු:

4.1 පර්යේෂණ සහ නව්‍යකරණය හරහා ක්‍රියාවලි සහ ක්‍රමවේද ක්‍රමවත් කිරීම

4.2 මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම

4.3 වේගවත් ආයතනික සංවර්ධනය සහ සම්පත් ප්‍රශස්තකරණය සහතික කිරීම

4.4 සුපිළිපන්භාවය කරා යොමුවූ ආයතනික හැසිරීම ප්‍රවර්ධනය කිරීම

## 4.1 පර්යේෂණ සහ නව්‍යකරණය හරහා ක්‍රියාවලීන් සහ ක්‍රමවේද ක්‍රමවත් කිරීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| රේගු මෙහෙයුම් වලදී අකාර්යක්ෂමතාවන් සහ අවහිරතාවන් හඳුනාගැනීම සඳහා දැනට පවතින ක්‍රියාවලීන් සහ ක්‍රමවේද පුළුල් ලෙස සමාලෝචනය කිරීම. | නිවැරදි කළ යුතු හඳුනාගත් අකාර්යක්ෂමතාවන් සහ අවහිරතාවන් |
| හඳුනාගත් අකාර්යක්ෂමතාවන් සහ අවහිරතාවන් නිවැරදි කිරීම සඳහා ඩිජිටල් වේදිකාවන්, ස්වයංක්‍රියකරණ මෙවලම් සහ දත්ත විශ්ලේෂණ වැනි නව්‍යකරණ විසඳුම් පර්යේෂණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. | ක්‍රමවත්වූ ක්‍රියාවලි සහ ක්‍රමවේද |
| පර්යේෂණ සහ සංවර්ධන රාමුවක් හඳුන්වාදීම. | කරුණු පදනම් තීරණ ගැනීම් |

## 4.2 මානව ප්‍රාග්ධන සංවර්ධනය

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| පුහුණු කිරීම සහ උපදේශණය සඳහා ආයතනික රාමුවක් වැඩිදියුණු කිරීම | පුහුණු කිරීම සහ උපදේශණය සඳහා ආයතනික රාමුවක් පැවතීම |

## 4.3 වේගවත් ආයතනික සංවර්ධනය සහ සම්පත් ප්‍රශස්තකරණය සහතික කිරීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| විද්‍යාත්මක සම්පත් කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම මගින් සම්පත් වෙන්කිරීම ප්‍රශස්ත කිරීම. | කාර්යක්ෂම සම්පත් කළමනාකරණය |
| පර්යේෂණ කිරීම සහ ආයතනික සංවර්ධනයේදී ප්‍රශස්ත ක්‍රියාවලි හඳුනා ගැනීම. | ජාත්‍යන්තරව පිළිගත් ප්‍රශස්ත ක්‍රියාවලි |
| අදාල ආයතන හෝ නියෝජිතායතන සමග හවුල්කාරීත්වයන් සහ සහයෝගීතාවන් ඇතිකර ගැනීම. | හොඳින් ස්ථාපනය වූ හවුල්කාරීත්වයන් සහ සහයෝගීතාවන් |
| හවුල්කරුවන් සමග දැනුම, විශේෂඥතාව සහ නිසි ක්‍රියාවලි හුවමාරු කිරීම. | අනුගත කරගනු ලැබූ ක්‍රියාවලි මත පදනම්ව වැඩිදියුණුවූ රේගු කාර්යසාධනය |
| රේගු කළමනාකාරීත්වය තුළ ප්‍රශස්ත ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම. | හවුල්කාරී ආයතන මගින් ධනාත්මක ප්‍රතිචාර සහ පිළිගැනීම |
| අඛණ්ඩව ඇගයීම සහ ප්‍රතිඵල සහ ප්‍රතිපෝෂණ මත පදනම් ක්‍රියාවලි උපයෝගිකර ගැනීම. | කාර්යක්ෂම සහ ඵලදායි රේගු මෙහෙයුම් |

## 4.4 සුපිළිපන්භාවය අරමුණු කරගත් ආයතනික හැසිරීම් රටාවන් ප්‍රවර්ධනය කිරීම

| උපායමාර්ගය | අපේක්ෂිත ප්‍රතිඵලය |
|---|---|
| සුපිළිපන් ක්‍රියාකාරී සැලැස්මක් (integrity action plan) සකස් කිරීම. | ස්ථාපිත විධිමත් සුපිළිපන් සංවර්ධන රාමුවක් |
| ආචාර ධර්ම සංග්‍රහයක් සහ සුපිළිපන් රාමුවක් සකස් කිරීම. | සදාචාරාත්මක හැසිරීමක් සහිත පුහුණු ශ්‍රම බලකායක් |
| සියලු සේවකයින් සහ පාර්ශවකරුවන් සුපිළිපන් රාමුව (integrity framework) පිළිබඳව දැනුවත් කිරීම. | සුපිළිපන් රාමුව පිළිබඳ දැනුවත්වූ සේවකයින් සහ පාර්ශවකරුවන් |
| විනිවිදභාවය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම මගින් ආචාර ධර්ම සංස්කෘතියක් නිර්මාණය කිරීම. | වගකිවයුතු සහ වගවියයුතු ශ්‍රම බලකායක් |
| සුපිළිපන්භාවය පිළිබඳ ගැටලු වාර්තා කිරීම සහ ඒවාට පිළියම් යෙදීම සඳහා ක්‍රම ඇති කිරීම. | ආචාර ධර්මයන්ට පටහැනි නොවන හැසිරීම් අවම කිරීම |
| ආචාර ධර්මයන්ට අනුව හැසිරීම සැළකීමට ලක්කිරීම සහ ඒ වෙනුවෙන් ත්‍යාග පිරිනැමීම. | සදාචාරාත්මක ශ්‍රම බලකායක් |
| ස්වයං අනුකූලතාවන්හි ප්‍රතිලාභ පිළිබඳව මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | පාර්ශවකරුවන්ගේ ඉහළ සුපිළිපන්භාවය |


CUSTOMS
MuseuM